කොළඹ දිසා අධිකරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක. 167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ - 10.

පැමිණිලිකරු

නඩු අංකය :- 21819/එම්.ආර්.

එදිරිව

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
"විසුම්පාය", ස්ටේපල්ස් වීදිය,
කොළඹ - 2.
සහ අංක. 37, කිරුළ පෙදෙස,
කොළඹ - 5.

2. හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ,
එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ - 1.

විත්තිකරුවන්

සිවිල් නඩු විධාන සංග්‍රහයේ (97 වන වගන්තිය සමග කියවිය යුතු) 94 වන වගන්තිය යටතේ ඉහත නම සඳහන් 2 වන විත්තිකාර සමාගම විවාජීම සඳහා, "X2" යනුවෙන් ලකුණු කොට මෙයට යාකොට ඇති ආකෘතියේ දැක්වෙන විචාරණ, ඒවා භාර කරනු ලැබීමෙන් දින දහයක් ඇතුළත එම විචාරණ වලට උත්තර දෙන ලෙසට ඔහුට නියම කරමින්, 2 වන විත්තිකාර සමාගමේ සභාපති, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, ඕ.වයි.ලියනගේ වෙත අධිකරණය මාර්ගයෙන් භාර කරවීමට අවසරය දෙන ලෙස ගරු අධිකරණයෙන් ඉල්ලා සිටිමි.

තවද, එකී විචාරණ ආපසු කැඳවීම සඳහා ඉතා ළඟ දිනයක් නියම කිරීමටද, ගරු අධිකරණය කාරුණික වන ලෙස ඉල්ලා සිටිමි.

තවද, පැමිණිලිකරුගේ නීතිඥ මහතාට මෙම මෝසම තහවුරු කර සිටීමට හැකිවනු පිණිස මෙම නඩුව වර්ෂ 1999 ක්වූ මැයි මස 04 වන දින විවෘත අධිකරණයේ කැඳවන ලෙසද, අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

වර්ෂ 1999 ක්වූ මැයි මස 03 වන දින දීය.

පැමිණිලිකරුගේ නීතිඥ.

කොළඹ දිසා අධිකරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක. 167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ - 10.

පැමිණිලිකරු

නඩු අංකය :- 21819/එම්.ආර්.

එදිරිව

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
"විසුම්පාය", ස්ටේපල්ස් වීදිය,
කොළඹ - 2.
සහ අංක. 37, කිරුළ පෙදෙස,
කොළඹ - 5.

2. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ,
එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ - 1.

විත්තිකරුවන්

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 97 වන වගන්තිය යටතේ, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, ඉහත නම සඳහන් 2 වන විත්තිකාර සමාගමේ සභාපති බී.වයි.ලියනගේ වෙතය.

ඉහත නම සඳහන් තැනැත්තාට භාර කරනු ලබන, ඉහත නම සඳහන් 2 වන විත්තිකාර සමාගමෙන් විචාරීම සඳහා ඉහත නම සඳහන් පැමිණිලිකරු වෙනුවෙන්, විචාරණ :

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් විචාරණ ඔබ වෙත භාර දී දින දහයක් ඇතුළත එම විචාරණ සියල්ලටම පිළිතුරු දීමට ඔබට නියම කරනු ලැබේ.

1. ඔබගේ සභාපති, බී.වයි.ලියනගේ -

(i) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් බව,

(ii) 1994 සිට එම ධූරය දරන බව, එසේ නොවන්නේ නම් ඒ කවදා සිටද?

(iii) රජය ඔබගේ කොටස් ප්‍රාග්ධනයෙන් 65% ක අයිතිය දරන නිසා, ඔහු භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධූරය දරන බැවින්, 1997/02/03 වන දින සිට ඔබගේ සභාපති ලෙස පත් කරනු ලැබූ බව.

(iv) යම් අවස්ථාවලදී ඔහු මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ භාණ්ඩාගාරයේ ලේකම්ද වශයෙන් ක්‍රියාකර තිබෙන බව.

(v) ඒ අනුව, ඔබට අදාළව මුදල් අමාත්‍යාංශයේ/භාණ්ඩාගාරයේ පවත්වා ගෙන යනු ලබන සටහන්, වාර්තා සහ ලේඛන ගැන වඩාත් විශේෂයෙන්ම යොමු අංකය. EA/05/26 දරන ලිපිගොනුවල ඇති ඒවා ගැන ඔහු දන්නා බව.

ඔබ පිළිගන්නෙහිද?

(vi)/

(vi) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් 1993 සිට ඔහු (මෙහි මින්පසු "සෙක්" ආයතනය යනුවෙන් සඳහන් කරනු ලබන) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයකු බව.

ඔබ පිළිගන්නේද? නැතිනම් කවදා සිටද?

2. ඔබගේ සභාපති ඕ.වයි.ලියනගේ වෙත,

(i) පැමිණිලිකරු විසින් භාණ්ඩාගාරයේ ලේකම් වෙත යවන ලද සහ ඔබගේ සභාපති ලෙස ඔහුට පිටපත් එවා ඇති වෙනත් දේ අතර පහත දින දැක්වෙන පැමිණිලිකරුගේ ලිපි/සංදේශ ලැබුණු බව ඔබ පිළිගන්නේද?

1997/04/01, 1997/04/22, 1997/06/13, 1997/08/18, 1997/10/22, 1998/01/30, 1998/03/23, 1998/06/29, 1008/08/12 සහ 1999/01/19 සියල්ල නොවේ නම් කවර ලිපි/සංදේශ ඔහු වෙත ලැබී තිබේද?

(ii) ඔබගේ සභාපති ලෙස ඔහු වෙත එවන ලද වෙනත් දේ අතර පැමිණිලිකරුගේ පහත දැක්වෙන දින දරන ලිපි/සංදේශ ලැබී තිබෙන බව ඔබ පිළිගන්නේද?

1998/09/21, 1998/10/13, 1998/10/15(2), 1998/10/16, 1998/11/23, 1998/11/26, 1998/11/27, 1998/12/01, 1999/01/18, 1999/01/19 සහ 1999/01/20(3) සියල්ල නොවේ නම් කවර ලිපි/සංදේශ ඔහු වෙත ලැබී තිබේද?

3. (i) සමාගමක සභාපති වෙත ඉදිරිපත් කරනු ලබන ලිපි/සංදේශ ඒ සමාගම වෙත කරනු ලබන සංදේශන බව.

(ii) ඒ අනුව ඉහත 2(i) හී හා 2(ii) හී සඳහන් කරන ලද ලිපි/සංදේශන ඔබ වෙත කරන ලද සංදේශන බව.

(iii) පැමිණිලිකරුගේ එකී ලිපිවල/සංදේශනවල පිටපත් භාණ්ඩාගාරයේ අනිත් නියෝජ්‍ය ලේකම්වරයා වූ ඔබගේ අධ්‍යක්ෂ ආචාර්ය පී.බී.ජයසුන්දර වෙතද යැවූ බව.

ඔබ පිළිනොගන්නේද?

4. ඔබ පහත සඳහන් දේවල් පිළිනොගන්නේද?

(i) සමාගම විසින් ඇතුළත් වන ලද සමථ ගිවිසුම් යටතේ ඉටු කිරීමට ඇති සියලු ඉතිරි කරුණු පිළිබඳව කටයුතු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ද, එයින් පැන නගින්නා වූ හා ඒ හා සම්බන්ධිත සියලු අවශ්‍ය ක්‍රියා සහ පියවර ගැනීමටද 1997/02/17 දින පැවැත්වූ ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, ඔබගේ සභාපති ඕ.වයි.ලියනගේට බලය පවරන ලද බව සහ බලය දෙන ලද බව.

(ii) ඒ අනුව, 1995/06/28 වන දින ඇතුළත් වූන එකී සමථ ගිවිසුම් සම්බන්ධයෙන් මැදිහත් වී ඔබට බරපතල පාඩු, අලාභ හානි හා පසුබෑමක් සිදුකල 1 වන වින්තිකරුට විරුද්ධව ඔබගේ යහපත පිණිස ක්ෂණික ක්‍රියාත්මක ක්‍රියාමාර්ගයක්, බියෙන් සහ අනුග්‍රහයෙන් තොරව ගැනීම සිදු කිරීමට ඔබ සභාපති වෙත බලය දී බලය පැවරූ බව ඔබ පිළිනොගන්නේද?
ඔහු එසේ කර තිබේද?

5. (i) පැමිණිලිකරු විසින් වාචික සහ ලිඛිත නියෝජන මගින්, 1 වෙනි විත්තිකරු විසින් ඔබට සිදුකර ඇති පාඩු, අලාභහානි හා බාධා පෙන්නුම් කර දෙමින් ඔබට ඔහු විසින් සිදුකල වැරදි ක්‍රියා සම්බන්ධයෙන් 1 වන විත්තිකරුට විරුද්ධව ඔහු විසින් කටයුතු කල යුතුව තිබුනු බවට ආයාචනය කළ බව.

(ii) 1998/10/14 වන දින පැවැත්වූ ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පැමිණිලිකරු විසින් ඉල්ලා සිටි පරිදි එකී කරුණ ඔබගේ නීතිඥවරුන් වෙත යොමු කිරීමට ඔහු විසින් භාරගත් බව සහ එසේ කිරීමට ඔහුට පසුදින සිහිපත් කරන ඔබගේ ලේකම්වරුන්ගෙන් ඔහු විසින් ඉල්ලා සිටි බව.

ඔබ පිළිනොගන්නෙහිද?

6. (i) පැමිණිලිකරුගේ 1998/09/04 දින දරන මණ්ඩලීය සංදේශය ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට භාජනය කිරීමෙන් ඉක්බිතිවම 1 වෙනි විත්තිකරු ඒ සම්බන්ධයෙන් ඔබගේ සභාපති හා මැදිහත් වූ බව.

(ii) 1 වෙනි විත්තිකරුගේ එකී මැදිහත්වීම නිසා 1998/10/14 වන දින පැවැත් වූ ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඔහු විසින් දෙන ලද සහතිකයට පිටුපා එම කරුණ ඔබගේ නීතිඥවරුන් වෙත යොමු කිරීමෙන් ඔහු වළක්වනු ලැබූ බව.

7. ඔබ පහත දැක්වෙන දේවල් ප්‍රතික්ෂේප කරන්නේද?

(i) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී ගන්නා ලද තීරණයක් මත ක්‍රියා කිරීම පිණිස ඒ තීරණය ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ස්ථිර කරන තුරු ප්‍රමාද කිරීම ඔබගේ සිරිත සහ ක්‍රියාපටිපාටිය නොවන බව.

(ii) ඇත්තවශයෙන්, ඔබගේ සිරිත සහ ක්‍රියාපටිපාටිය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පිළිබඳව ප්‍රගතගිය ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට වාර්තා කිරීම බව.

(iii) 1999/01/20 වන දින පැවැත් වූ මණ්ඩලීය රැස්වීමේදී කටයුතු අවසන් කරන ලද ඔබගේ මේ නඩුවේ උත්තරය 1999/03/18 වන දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ස්ථිර කර ගැනීම පිණිස නොනබා 1999/01/21 වන දින ගොනු කරන ලද බව.

8. ඔබ පහත දැක්වෙන දේවල් පිළිනොගන්නේද?

(i) සම්බන්ධතා පිළිබඳ ගැටුමක් තිබියදීත්, පැමිණිලිකරු විසින් පෙන්වා දෙන ලද එකී කරුණු සැළකිල්ලට නොගෙන ඔබගේ එකී උත්තරය පිළිබඳ කටයුතු නිම කරනු ලැබූ රැස්වීමෙහි සාකච්ඡා වලට කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමාගමේ නියෝජිතයන්ට සහභාගිවීම පිණිස අවසර දෙන ලද බව.

(ii) පැමිණිලිකරු විසින් තරයේම දැරූ එකී ස්ථාවරය 1999/03/12 වන දින දරන ස්වකීය ලිපිය මගින් ඔබගේ අධිනීතිඥවරයා විසින් ස්ථිර කරන ලද බව.

9. ඔබ පහත දැක්වෙන දේවල් පිළිනොගන්නේද?

(i) 1 වන විත්තිකරු විසින් සිදු කරන ලද සමථ ගිවිසුමේ අත්හිටවීම හේතුකොටගෙන අතිරේක පොලී, ගෙවීම් මගින් ඔබට සිදු වූ අලාභයෙන් මිට්සූයි සහ තායිසේ සමාගම් වලට ලාභ ප්‍රයෝජන ලැබුණු බව.

(ii)/

(ii) මිට්සුයි සහ තායිසේ සමාගම් වලට මුදල් අමාත්‍යාංශය විසින් පරිපාලනය කරනු ලබන රජය විසින් ඔවුනට දුන් ඇපවීම් තිබෙන බව.

(iii) එකී කරුණු නිසා මිට්සුයි සහ තායිසේ සමාගම් 1 වෙනි වින්තිකරුට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගැනීම පිණිස එකඟ නොවනු සහ ඔවුන්ට එකඟ විය නොහැකි බව.

10. ඔබ පහත දැක්වෙන දේවල් ප්‍රතික්ෂේප කරන්නේද?

(i) 1 වන විත්තිකරු රාජ්‍ය අමාත්‍යවරයෙකු වීම නිසා සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වශයෙන් 1 වෙනි විත්තිකරුගේ අධීක්ෂණය, පාලනය සහ විධානය යටතේ විශේෂයෙන්ම ඔබගේ සභාපති ඩී.වයි.ලියනගේ සහ අධ්‍යක්ෂ ආචාර්ය පී.බී.ජයසුන්දර භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන් ලෙස ඔවුන්ගේ කාර්ය භාරයන් කිරීම නිසා 1 වන විත්තිකරුට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගැනීම ගැන සළකා බැලීමට පවා ඔවුනට නොහැකි වන බව ඔබ පිළිනොගන්නේද? නොවේ නම් ඒ ඇයි?

(ii) ඔබ සභාපති ඩී.වයි.ලියනගේ සහ අධ්‍යක්ෂ ආචාර්ය පී.බී.ජයසුන්දර වෙත යවන ලද සංදේශ/ලිපි ගණනාවක් මගින් එකී කාරණයෙහි බරපතලකම සහ බැරෑරුම්කම ගැන පැමිණිලිකරු විසින් පෙන්වා දී තිබියදීත් ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා ලද බව ඔබ පිළිනොගන්නේද?

11. (i) මෙම නඩුවේ පැමිණිල්ලෙහි පැමිණිලිකරු විසින් සම්ප්‍රකාශ කර ඇති ස්ථාවර බොහොමයක්ම, කෝර්නල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමාගම විසින් ගොනු කරන ලද කොළඹ දිසා අධිකරණයේ අංක.5095/විශේෂ දරන නඩුවේදී සහ බස්නාහිර පළාතේ (සිවිල්) මහාධිකරණයේ අංක.1/98(2) දරණ නඩුවේදී විත්තිකරුවෙකු වශයෙන් ඔබ විසින් ගත් ස්ථාවරයන් වන බව.

(ii) එකී ස්ථාවරයන් සත්‍ය බවට සහතික කරමින් එකී නඩුවලදී ඔබගේ සභාපති ඩී.වයි.ලියනගේ විසින් ඔබ වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශ ගොනුකර ඇති බව.

(iii) එකී නඩුවලදී ඔබ විසින් ගොනු කරන ලද විරෝධතා හා උත්තර ඔබගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කර ඇති බව.

(iv ඔබ විසින් එහි උත්තරය පිළිබඳ කටයුතු අවසන් කිරීමට කලින් මෙම තත්ත්වය ගැන පැමිණිලිකරු විසින් ඔහුගේ සංදේශය මගින් ඔබගේ අවධානය යොමුකල බව.

ඔබ පිළිනොගන්නේද?

12. (i) ඔබගේ සභාපති ඩී.වයි.ලියනගේ, "සෙක්" ආයතනයේ සාමාජිකයෙකු වශයෙන්, වෙනත් දේ අතර, ඔබ වෙනුවෙන් වූ පැමිණිලිකරුගේ කොළඹ දි.උ. අංක.3155/විශේෂ දරණ ව්‍යුත්පන්න නඩුවට, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවද ඇතුළුව අදාළ වන්නා වූ සිද්ධාන්ත සහ ලේඛණ එවකට සිටි සෙක් ආයතනයේ සාමාජිකයන්ගේ විශේෂිත දැනගැනීමට පැමිණිලිකරු සහ/හෝ ඔහුගේ නීතිඥවරුන් වන ද සිල්වා සහ පෙරේරා මහතුන් විසින් ලිඛිත නියෝජන ගණනාවක් මගින් සැලසූ බව ඔබ පිළිනොගන්නේද?

(ii)/

(ii) බැලූ බැල්මටම වංචාවක් නිරූපිත නඩුවක් ලෙසට පැමිණිලිකරුගේ නඩුව පිළිගනිමින් 1992 දෙසැම්බර් මාසයේදී දෙන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව මත පවා එවකට සිටි ඔබගේ අධ්‍යක්ෂකවරුන් විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීම හේතුකොට ගෙන, මෙම කාරණය පරීක්ෂා කර බැලීමට විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් පත් කිරීමට යෙදුන බව ඔබ පිළිනොගන්නේද ?

13. (i) සෙක් ආයතනයේ සාමාජිකයකු වශයෙන් ඔබගේ සභාපතිවරයා "සෙක්" ආයතනයේ සාමාජිකයන් වෙත යැවූ ලිඛිත නියෝජනයන් මගින් ඔබේ සමාගමේ 1990.03.31 දිනට වූ වාර්ෂික ගිනුම් වලට අදාල කොළඹ දි.උ. අංක.3231/විශේෂ දරණ නීතියෙන් තවත් ව්‍යුත්පන්න නඩුවකටද අදාළ වූ බවත් එම නඩුවේ ප්‍රතිඵලයක් වශයෙන් අධිකරණය විසින් එම ගිණුම් වාරණය කරන ලද බවත් ඔබ පිළිනොගන්නෙහිද?

(ii) ඔබේ කටයුතු පවත්වාගෙන යාමත් සහ ඔබගේ වාර්ෂික ගිණුම්, සංශෝධිත පරිදි වූ 1987 අංක.36 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනතේ විධිවිධාන පරිදි සෙක් ආයතනයේ විෂය පථය තුළට ගැනෙන බව සහ එහි රීති මගින් පාලනය වන බව ඔබ පිළිනොගන්නෙහිද?

14. ඉහත 11 වන විචාරණයේ සඳහන් නඩුවලදී ඔබගේ විරෝධතාවල/උත්තරවල ඔබ විසින් පහත දැක්වෙන පරිදි සම්ප්‍රකාශ කර නැද්ද?

(i) මුදල් ඇමති විසින් එකී කාරණය සමාලෝචනය කරන ලදුව සෙක් ආයතනය විසින් <u>සුදුසු ප්‍රතිකර්ම ගත යුතු</u> බවට විධාන කර ඇති බව සඳහන් කරමින්, මේ සම්බන්ධයෙන් නිසි පියවර ගන්නා මෙන් සෙක් ආයතනයට නියම කරමින්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1994/09/23 වන දින දරණ ලිපිය සෙක් ආයතනය වෙත යවා ඇති බව.

(ii) එසේ කිරීමට භාර ගනිමින්, සෙක් ආයතනයේ සභාපතිවරයා විසින් 1994/10/06 දින දරණ ලිපිය මගින් ඊට පිළිතුරු දුන් බව.

15. ඉහත 11 වන විචාරණයේ සඳහන් නඩුවලදී ඔබගේ විරෝධතාවල/උත්තරවල ඔබ විසින් පහත දැක්වෙන පරිදි සම්ප්‍රකාශ කර නැද්ද?

(i) හිල්ටන් සමථ ගිවිසුම්වල තත් කාරණය සම්බන්ධයෙන් නිශ්චිත කොන්දේසියක් ඇතුළත් කිරීම මාර්ගයෙන්, ව්‍යවස්ථාමය රාජකාර්යයන් පැහැර හැරීම සහ අතපසු කිරීම සඳහා වෙනත් තැනැත්තන් අතරෙහි සෙක් ආයතනයේ එවකට සිටි සාමාජිකයන්ට විරුද්ධව රජය විසින් ක්‍රියාකළ යුතුව තිබෙන බව එවකට සිටි නීතිපතිවරයා වූ ජනාධිපති නීතිඥ තිලක් මාරපන විසින් සහ එවකට සිටි අතිරේක සොලිසිටර් ජනරාල් (දැන් ජනාධිපති නීතිඥ) ශ්‍රීනාත් පෙරේරා සළකා බැලූ බව.

(ii) ඉන් අනතුරුව, සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ ඩග්ලස් ප්‍රේමරත්න, ඊට එකඟත්වය පළ කල බව.

16./

16. ඉහත සම්ප්‍රකාශ කර ඇති පරිදි,

(i) සමථය ගිවිසුම් හි, නිශ්චිත වගන්තියකින්. එහි <u>පූර්ණත්වයට අවශ්‍ය වන්නා වූ කොටසක්</u> අත්හැර, ඉන් කොටසක් පමණක් පද සම්බන්ධතාවයෙන් තොරව උපුටා දක්වමින්, 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුවේදී 1 වන විත්තිකරු විසින් ප්‍රකාශයක් කරනු ලැබූ බව ඔබ පිළිනොගන්නේද?

(ii) එහි මැද කොටස පමණක් හුවා දක්වමින් එම ඡේදයෙහි පහත සඳහන් <u>පළමු</u> සහ <u>අවසන් කොටස්</u> 1 වන විත්තිකරු විසින් අත්හැර දැමුවේ නැත්ද?

***"Whereas in the context of the promotion of the Colombo Hilton Hotel and/or Hotel Developers (Lanka) Ltd., Nihal Srinath Ameresekere (hereinafter referred to as "Mr. Ameresekere") of 167/4, Sri Vipulasena Mawatha, Colombo 10, having been induced by the main promotors thereof to get involved and/or concerned in the affairs of Sun-Cornel Textiles Ltd., and the Colombo Apothecaries Co. Ltd., and in consideration of the settlement initiated by the Government and the write-offs, reductions and rescheduling referred to in Agreement No.1, the Government as the major Shareholder and Guarantor, being a beneficiary thereof and further in the context of the conditions stipulated in Clause 9 in the Agreement No. 4 shall and will assist Mr. Ameresekere ..........................................................................................***

.........................................................................................................

**[middle part only quoted to Parliament]**

(මැද කොටස පමණක් පාර්ලිමේන්තුවේ හුවා දැක්වූවේය)

.........................................................................................................

***...... and whereas in some of the said Actions, Mr. Ameresekere had been added and/or had been moved to be added as a party and/or an accused only after the institution of the litigations referred to in the aforesaid Agreement No. 3, to which this Annexure "Y" relates"***

(iii) එමගින් 1 වන විත්තිකරු විසින් පාර්ලිමේන්තුවට කරන ලද්දේ නොමග යවන සුළු ප්‍රකාශයක් නොවන්නේද?

17. සමථ ගිවිසුම්වල, විශේෂයෙන්ම 1 වන විත්තිකරු විසින් එලෙස නොමඟ යවන සුළු අන්දමින් සඳහන් කරන ලද අංක. 3 දරණ ගිවිසුමෙහි :

(i) පූර්විකාවෙහි, ජපන් සමාගම්වල (මිට්සුයි සහ තායිසේ) ඉල්ලීම පිට, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, එවැනි සමථයක් ඇතිකර ගැනීමේ අදහසින් පැමිණිලිකරු සමග සාකච්ඡා කිරීමට ඉදිරිපත් වූ බව සඳහන් කර ඇති බව.

(ii) පැමිණිලිකරු විසින් කරන ලද නියෝජනයන් මත සෙත් ආයතනයේ සාමාජිකයන්ගේ කල්ක්‍රියාව සහ ක්‍රියාකලාපය ගැන සෙත් ආයතනයේ එවකට සාමාජිකයන්ට එරෙහිව රජය විසින් ක්‍රියා කළයුතු සහ ක්‍රියා කරනු ලබන බවට කොන්දේසියක් දරණ සමථ ගිවිසුමේ අඩංගු වූන අතර, පැමිණිලිකරු විසින් ක්‍රියාමාර්ගයක් ඉදිරියට ගෙන යෑමේ අයිතියද ඔහු විසින් රඳවා ගත් බව.

ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

18. ඔබගේ සභාපතිවරයා, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් පහත දැක්වෙන කරුණු දන්නා බව පිළිනොගන්නේද?

(i) යොමු අංක. EA/05/26 දරණ මුදල් අමාත්‍යාංශයේ ලිපිගොනුවෙන් අනාවරණය වන පරිදි, මුදල් අමාත්‍යවරයා විසින් 1995 ජූනි මස 21 වන දිනට කලින් අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු පැහැදිලි කර තිබුණු අතර, 1995 ජූනි මස 28 වන දින හෝ ඊට ආසන්න දිනකදී අමාත්‍ය මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද එකී හිල්ටන් සමථය පිළිබඳ 1995 ජූනි මස 21 වන දින දරණ කැබිනට් සන්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද බව.

(ii) ලියා අත්සන් කිරීමට නියමිත සමථ ගිවිසුම් සොලිසිටර් ජනරාල්වරයා විසින් නිමකර තිබෙන බවත්, එකී සමථය ගැන සොලිසිටර් ජනරාල්වරයා විසින් විශේෂ ජනාධිපති කොමිෂන් සභාව දැනුවත් කර ඇති බවත්, එකී කැබිනට් සන්දේශයෙහි සඳහන් කර ඇති බව සහ ඉහත අංක. 11 විචාරණයේ සඳහන් ඔබගේ විරෝධතා/උත්තරවල ඔබ එසේ පිළිගෙන ඇති බව.

19. එකී අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි, වෙනත් දේ අතර, මෙසේ සඳහන් කර තිබුණු බව ඔබ පිළිනොගන්නෙහිද?

(i) "ඉනික්බිති 1992 දෙසැම්බරයේදී අග්‍ර විනිශ්චයකාරතුමා විසින් මුලසුන දැරූ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දිසා අධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග ස්ථිර කර සිටින ලදී. ඒ නඩු තීන්දුව ප්‍රකාශයට පත් කරමින්, බලවත් විත්තිවාචකයක් ඉදිරියෙහි පවා, අමරසේකර මහතා විසින් සාධාරණ වූද, සාර්ථකත්වය පිළිබඳ යථාර්ථ බලාපොරොත්තුවක් සහිත වූද, බලගතු බැලූ බැල්මට පෙනෙන නඩුවක් තහවුරු කර ඇති බවත්, අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග නිකුත් කරනු ලැබ ඇත්තේ අති විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වකු ලෙස මෙරටින් වෙන'තකට හැරවීම සඳහා බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිරීක්ෂණය කරන ලදී."

(ii)/

(ii) "ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්වකීය නඩු තීන්දුවෙහි වෙනත් දේ අතර, තමදුරටත් විශේෂයෙන්, සඳහන් කරන ලද අවස්ථාගත කරුණු අනුව, ආණ්ඩුව බහුතර කොටස්හිමියා සහ ඇපකරු වන බැවින්, මෙය, මුළුමනින්ම රජයට දැක් වූ උදාසීනත්වය පිළිබඳ කාරණයක් විය නොහැකිය. දක්වා ඇති කරුණු අනුව, ක්‍රියාමාර්ගයක් ගත යුතුව තිබුනේ රාජ්‍ය අරමුදල් මත බර පැටවීමක් වන රජය විසින් ඇප වූ විශාල ප්‍රමාණයේ ණය සහිත වූද, රජය විසින් අයිතිය දරන්නා වූද, එකී සමාගම වෙනුවෙන් ක්‍රියා කරමින් තනි කොටස්හිමියකු වශයෙන්, සාමාන්‍ය පුරවැසියකු වූ අමරසේකර මහතා විසින් නොව, රජය විසින් මය".

20. 1 වන විත්තිකරු විසින් 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයෙහි, පැමිණිලිකරු විසින් හිල්ටන් හෝටල ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුට විරුද්ධව පැවරීමට යෙදුනු සංසන්දනාත්මකව නොවැදගත් නඩු කිහිපයක් ගැන ඔහු විසින් විශේෂයෙන් සඳහන් කර තිබුණු බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? ඒ නඩු පැමිණිලිකරුට විරුද්ධව පැවරීමට තුඩු දුන් නිශ්චිත ආකාරය සහ පැමිණිලිකරුට සහාය වීමට ආණ්ඩුව බන්ධනය වූයේ කුමක් නිසාද යන වග සඳහන් වන ඒ ඡේදයේ ඊට අදාළ කොටස 1 වන විත්තිකරු විසින් යටපත් කළ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

21. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද 1995 ජූනි මස 28 වන දිනැති එකී අමාත්‍ය මණ්ඩල සංදේශයේ වෙනත් දේ අතර මෙසේ සඳහන් නුවූයේද?

"මේ කාරණය සමස්තයක් වශයෙන් ගෙන ඒ පිළිබඳව විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් පරීක්ෂණයක් පවත්වන අතර ඒ මත වාර්තාවක් රජයට සහ මහජනයාට සපයනු ලැබේ. කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ පදනම් කරගෙන උචිත ක්‍රියා මාර්ගයක් ගැනීම රජය විසින් සළකා බලනු ඇත. මේ සම්බන්ධය ගැන සොලිසිටර් ජනරාල්වරයා විසින් කොමිෂන් සභාව දැනුවත් කොට ඇත."

22. 1995 ජූලි මස 25 වන දිනැති "ඩේලි නිව්ස්" පත්‍රයේ වාර්තා කර ඇති පරිදි 1 වන විත්තිකරු පුවත් වලට මෙසේ ප්‍රකාශ කලේ නැද්ද?

"විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් පවත්වන හිල්ටන් කාරණය පිළිබඳව පරීක්ෂණය නිමවන තෙක් සම්බන්ධයෙන් අදහස් කර ඇති ගෙවීමක් සිදු කිරීම හෝ සම්බන්ධයේ වෙනත් යම් අංශයක් කවර හෝ ආකාරයකින් ක්‍රියාත්මක කිරීම හෝ කරනු නොලැබේ".

23. (i) 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුවේදී 1 වන විත්තිකරු විසින් මෙසේ ප්‍රකාශ කලේ නැද්ද ?

"මේ කාරණය පිටුපස ඇති සිද්ධි හෙළි කිරීමට මැතිවරණ ව්‍යාපාරයේදී පොදු ජන එක්සත් පෙරමුණ පොරොන්දු වූ අතර එම පොරොන්දුව ඉටු කිරීම් වස් ගනුදෙනුව පිටුපස ඇති අවස්ථාගත කරුණු පිළිබඳව පරීක්ෂණ කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරන ලදී. මේ කොමිෂන් සභාව විසින් මේ කාරණා පිළිබඳ පරීක්ෂණ දිගටම පවත්වන බවද, මේ රටේ නීති යටතේ වරදකරුවන්ට විරුද්ධව කටයුතු කරන බවට සහතික වීමට අවශ්‍ය සියලු පියවර රජය විසින් ගන්නා බවද, නැවතත් ප්‍රකාශ කළ යුතුය".

"කෙසේ/

"කෙසේ වුවද හිල්ටන් ව්‍යාපෘතිය පිටුපස ඇති උද්දේශිත වංචාව සහ අනිසි ක්‍රියා වලට අදාළ අවස්ථාගත කරුණු ගැන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සොයා ගන්නා කරුණු ගැන කටයුතු කිරීම ප්‍රමාද කිරීමට හෝ එම කටයුතු පසෙක තැබීමට කිසිම අවස්ථාවක කිසිම චේතනාවක් හෝ අදහසක් නොතිබූ බව ද, කොමිෂන් සභාව විසින් යම් වැරදි ක්‍රියාවක් සොයා ගනු ලැබුවහොත්, හෝ එවැනි ක්‍රියාවක් බව තීරණය කලහොත් රටේ නීති යටතේ එම ක්‍රියා සම්බන්ධයෙන් තදින් කටයුතු කිරීම රජයේ අදහස වශයෙන් දිගටම පැවති බව ද, නැවතත් ප්‍රකාශ කළ යුතුය".

(ii) නැවත 1995 සැප්තැම්බර් මස 19 වන දින 1 වන විත්තිකරු විසින් පාර්ලිමේන්තුවට පහත සඳහන් අයුරු ප්‍රකාශ කලේ නැතිද ?

"හිල්ටන් ව්‍යාපෘතිය පසුපස සිදු වී ඇතැයි කියනු ලබන වංචා සහ අයථා ක්‍රියාවන්ට අදාළ වන්නා වූ තත්ත්වාකාරයන් තුළට විශේෂ ජනාධිපති කොමිෂම විසින් පවත්වා ගෙන යනු ලබන පරීක්ෂණ කෙරෙහි භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සමථය ගිවිසුම් අත්සන් කිරීම, කිසිසේත්ම බලපෑමක්, අඩපණ වීමක් හෝ විපාකයක් සිදු නොවනු ඇත හෝ සිදු නොවිය යුතුය, වරද සිදු කිරීමක් කොමිෂම විසින් අනාවරණය කර ගනු ලැබුවහොත් හෝ සොයාගත හොත්, වරදකරුවන්ට එරෙහිව රටෙහි නීති යටතේ දැඩිලෙස ක්‍රියා කිරීමේ රජයේ අරමුණ එලෙසම පවතින්නේය".

(iii) ව්‍යවස්ථාපිතව ඔබ විසින් කළ යුතුව තිබෙන පරිදි එකී කාරණය පිළිබඳව සෙක් ආයතනයේ අනිකුත් සාමාජිකයන්ද ඇතුළු 1 වන විත්තිකරු විසින් ක්‍රියාමාර්ගයක් නොගත් බව ඔබ පිළිනොගන්නේ ද ?

24. (i) පැමිණිලිකරුගේ ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති කරගත් හිල්ටන් සමථය රජයට සහ රටට ඉමහත් ලෙස වාසි සහගත වූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) පැමිණිලිකරුට අදාළ වූ එක් කොන්දේසියක් රජයට පිළිගත නොහැකි කොන්දේසියක් වශයෙන් අවධාරණයෙන්ම දක්වමින්, 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුව, එමගින් මහජනයා නොමඟ යැව්වේත්, එයද ඊට අදාළ සම්පූර්ණ කරුණුත්, අනාවරණය නොකරමින් 1 වන විත්තිකරු උත්සාහයන් දැරූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) <u>රු.මිලියන 10,200 ක කපා හැරීමක්ද සහිතව,</u> ඉතිරි ණය මුදල වර්ෂ 2010 තෙක් තවත් වසර 15 පුරා අඩු පොලියකට ගෙවීමට නැවත ප්‍රතිලේඛණගත කිරීමක් සලස්වමින් රජයට සහ රටට ඉමහත් ලාභ ප්‍රයෝජනයක ප්‍රතිඵලයක් වූයේ පැමිණිලිකරුගේ ධෛර්යවන්ත තනි ප්‍රයත්නය නිසා වන බව ඔබ පිළිගන්නේ නැද්ද? පිළිනොගන්නේ නම් එම ප්‍රතිඵලය ගෙන දුන්නේ කාගේ ප්‍රයත්නයකින්ද?

(iv) එසේ කරන ලෙසට පැමිණිලිකරු/පැමිණිලිකරුගේ නීතිඥයන් විසින් කරන ලද එකී නොයෙකුත් කරුණු නියෝජනය කර පෙරත්ත කිරීම නොතකමින් 1 වන විත්තිකරු ඇතුළු සෙක් ආයතනයේ එවකට සාමාජිකයන් විසින් ඔබ හා සම්බන්ධයෙන් කවර අන්දමේ හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම පැහැර හැර සහ අතපසු කර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

25. (i) වෙනත් දේ අතර, <u>**එම දිනය "ඔහුගේ ජීවිතයේ ප්‍රීතිමත්ම දිනය"**</u> බව කියමින් සමථය සඳහා ප්‍රසංශාව ඔබ ලබා ගනිමින් සමථය ඔබේ හෝ රජයේ ජයග්‍රහණයක් බව පෙන්වා සිටිමින් ඔබ කීර්තියෙන් නැහැවෙමින් පැමිණිලිකරුට නීත්‍යානුකූලව හිමි ගෞරවය පැමිණිලිකරුගෙන් සොරා ගනිමින්,

(ii) "ජපන් කොන්ත්‍රාත්කරුවන් සමග අත්සන් කරන ලද සමථය <u>ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම</u> මර්ධනය කිරීමේ පොදු පෙරමුණ රජයේ මැතිවරණ ප්‍රකාශනයේ ප්‍රධාන ප්‍රතිපත්ති වලට සහ විශාල ප්‍රමාණයේ ඉතිරිවීමක් ඇති කරගෙන ඇති රජයේ කැප වීමට අනුකූල වන බවත්, (අවධාරණය දක්වමින්)

1995 ජූලි මස 30 වන දින හෝ ඒ ආසන්නයේදී පුවත්පත් සාකච්ඡාවේදී 1 වන විත්තිකරු ප්‍රකාශ කළ බව ඔබ පිළිනොගන්නෙහිද?

26. (i) 1 වන විත්තිකරු විසින් ප්‍රකාශ කර ඇති පරිදි <u>ජාතික "සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම"</u> වළක්වා ගැනීම සඳහා පැමිණිලිකරු විසින් ඔවුන්ට දන්වා තිබූ නොයෙකුත් බරපතල කාරණා ගැන ක්‍රියාමාර්ගයක් ගැනීම ඔබගේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම විය යුතුව තිබූ බව ඒ අනුව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) 1 වන විත්තිකරු විසින් එසේ ප්‍රකාශ කර ඇති පරිදි දැන සිටි බරපතල අවස්ථාගත කරුණු යටතේ <u>"ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසා කෑම"</u> වැළැක්වීම සඳහා පැමිණිලිකරු විසින් ෆෝර්ඩ් රෝඩ්ස් තෝර්න්ටන් සමාගමේ විගණකවරුන්ට දන්වා තිබූ ආකාරයට, එම විගණකවරුන් ඔබගේ වාර්ෂික ගිණුම් සහතික කිරීමෙන් වැළකී සිටිය යුතු වූයේ යැයි ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) 1990 සිට පැමිණිලිකරු විසින් අනාවරණය කළ/හෙළි කල බරපතල අවස්ථාගත කරුණු අනුව ප්‍රධාන කොටස්කරු සහ ඇපකරු වන රජය ඉක්මන් සහ ඵලදායී ක්ෂණික ක්‍රියාමාර්ගයක් ගත්තේ නම් <u>"ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම"</u> එසේම වළක්වන්නට තිබුණේ නැද්ද?

(iv) 1 වන විත්තිකරු විසින් කියා ඇති පරිදි ඔබ සෙක් ආයතනයේ ඇති නියෝග වලින් පාලනය වන නිසා එම ජීති සහ නියෝග උල්ලංඝනය කෙරෙන බරපතල විෂමාචාර කිහිපයක් පැමිණිලිකරු විසින් සෙක් ආයතනයේ සාමජිකයකු වශයෙන් 1 වන විත්තිකරුද ඇතුළුව, එවකට එකී සාමාජිකයන්ට <u>"ජාතික සම්පත්වල එකී කොල්ලකෑම සහ ගසාකෑම"</u> වළක්වා ගැනීම සඳහා, ඔබ විසින් එසේ ප්‍රකාශ කර ඇති පරිදි, ක්‍රියා මාර්ගයක් ගත යුතුව තිබුනු බව ඔබ පිළිගන්නේ නැද්ද?

(v) සෙක් ආයතනයට සහ එහි සාමාජිකයකු වශයෙන් 1 වන විත්තිකරුට නොයෙකුත් කරුණු පැමිණිලිකරු/පැමිණිලිකරුගේ නීතිඥවරුන් විසින් නියෝජනය කිරීමේ අවස්ථාගත කරුණු යටතේ <u>"ජාතික සම්පත් එසේ කොල්ලකෑමට සහ ගසා කෑමට"</u> අදාළ අවස්ථාගත කරුණු සහ සිද්ධි සෙක් ආයතනය හොඳින් දැනසිටි බව ඔබ පිළිගන්නේ නැද්ද?

27./

27. (i) නියෝජ්‍ය මුදල් ඇමතිවරයා වශයෙන් 1 වන විත්තිකරු විසින් විධාන කර තිබූ ආකාරයට මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් මිට්සුයි සහ තායිසේ වෙත 1995/07/24 දින දරණ ලිපි ලියා ඇති බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

(ii) විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීක්ෂණයේ තීරණය දෙන තෙක් සමථය ක්‍රියාත්මක නොකරන බව එකී ලිපිවල ප්‍රකාශ කර ඇති බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

(iii) විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීක්ෂණය තවමත් නිමකර සහ නිශ්චය කර නැති බව ඔබ ප්‍රතිකෙෂ්ප කරන්නේද?

(iv) විශේෂ ජනාධිපති පරීකෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීකෂණය නිමකර තීරණය කිරීමට පෙර 1996 ඔක්තෝබර් මාසයේදී හිල්ටන් සමථය ක්‍රියාත්මක කළ බව ඔබ ප්‍රතිකෙෂ්ප කරන්නේද?

28. (i) 1995 ජූලි මස 25 වන දින ඩේලිනිවුස් පත්‍රයේ වාර්තා කළ ආකාරයට හිල්ටන් සමථය අත්හිටවීම නිවේදනය කිරීමේදී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් කාරණය පිළිබඳ පරීකෂණය නිමකරන තෙක් සමථය කෙසේවත් ක්‍රියාවේ නොයෙදවන බවට 1 වන විත්තිකරු ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) 1996 ඔක්තෝබර් මාසයේ දී සමථය ක්‍රියාත්මක කර බලාත්මක කරනු ලැබූ විට, විශේෂ ජනාධිපති පරීකෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීකෂණය නිමකර තීරණය කරන තෙක් හිල්ටන් සමථය ක්‍රියාත්මක නොකිරීමේ ඉහත කී ස්ථාවරය ඉවත් කර ගැනීම පිළිබඳව කිසිම ප්‍රසිද්ධ ප්‍රකාකශයක් හෝ පැහැදිලි කිරීමක් 1 වන විත්තිකරු විසින් නොකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) 1 වන විත්තිකරු විසින් 1995 අගෝස්තු මස 8 වන දින පාර්ලිමේන්තුවේදී පිළිගත් පරිදි නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වශයෙන් හිල්ටන් සමථය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම 1 වන විත්තිකරු විසින්, මුදල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපති කුමාරතුංග මැතිනිය සමග මැදිහත් වීමෙන් සිදුකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

29. (i) නීත්‍යානුකූලව සහ ගිවිසුම්මය වශයෙන් එළඹෙන ලද එකී සමථ ගිවිසුම් අත්හිට වූයේ කවර නෛතික පදනමක් මතද?

(ii) ඔබගේ ඉහත කී ක්‍රියා කලාපය සහ ක්‍රියා ඉහත කී පරිදි 1995 ජූනි මස 30 වන දින පැවැත්වූ කලින් පුවත්පත් සාකච්ඡාවේදී 1 වන විත්තිකරු දැරූ ස්ථාවරය සැළකිය යුතු ලෙස ආපසු කරකැවීමක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii)/

(iii) එවැනි සැලකිය යුතු ආපසු කරකැවීමක් කළේ එවකට සෙක් ආයතනයේ සාමාජිකයකු වශයෙන් 1 වන විත්තිකරුට විරුද්ධව ක්‍රියා කිරීමට වූ කොන්දේසිය අභිමුඛයේ 1 වන විත්තිකරුගේ පුද්ගලික යහපත උදෙසා බව ඔබ පිළිගන්නේ නැද්ද?

30. (i) 1995 ජූනි මස 28 වන දින හිල්ටන් සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට <u>පෙර</u>,පැමිණිලිකරු විසින් හිල්ටන් සමථයට අදාළ සියලු වැදගත් ලේඛණ සහ කරුණු සොලිස්ටර් ජනරාල්වරයා මගින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සාක්ෂි වශයෙන් ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) එකී සමථ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පෙර,එම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව සොලිස්ටර් ජනරාල්වරයා ලිඛිත අනුමතිය දී තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) 1995 ජූනි මස 28 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද 1995 ජූනි මස 21 වන දින අමාත්‍ය මණ්ඩල සන්දේශයේ වෙනත් දේ අතර - "සොලිස්ටර් ජෙනරාල්වරයා මේ සමථය ගැන කොමිෂන් සභාව දැනුවත් කර ඇත." යනුවෙන් ප්‍රකාශ කර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද"

(iv) 1995 ජූනි මස 28 වන දින සමථ ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව පැමිණිලිකරු, අත්සන් කර තිබූ සමථ ගිවිසුම් ගැන සොලිස්ටර් ජනරාල්වරයා මාර්ගයෙන්, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ ප්‍රසිද්ධියේ සාක්ෂි දී ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

(v) පැමිණිලිකරු විසින්, එමගින්, ජනමාධ්‍යවල පුළුල් ප්‍රචාරයක් දී තිබූ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ප්‍රසිද්ධ විභාගවලට පෙර, හිල්ටන් සමථ ගිවිසුම් නිමකිරීම සහ අවසාන වශයෙන් සකස් කිරීම පිළිබඳ කටයුතු, සම්පූර්ණ අනාවරණය කිරීම් සහිතව සිදුකර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

(vi) පාරදෘශ්‍යතාවය පිළිපැදීමට රජයට ඇති ගැඹුරු සහ සුපැහැදිලි කැපවීම ගැන නොසලකා, රජයේ කොන්ත්‍රාත්තු අවසාන වශයෙන් සකස් කිරීමේ හා නිම කිරීමේ රජය අනුගමනය කරන <u>සාමාන්‍ය සිරිත සහ පටිපාටිය එසේ නොවන බව</u> ඔබ පිළිගන්නේ නැද්ද?

(vii) හිල්ටන් සමථ ගිවිසුම තරම් ප්‍රසිද්ධ අනාවරණය කිරීම් සහ පාරදෘශ්‍යතාවයක් නොමැතිව කලම්බු ගෑස්, ඔරියන්ට් ලංකා, කොටගල, එයාර් ලංකා, තවක්කාල් ආදිය වැනි වෙනත් කොන්ත්‍රාත්තු/ගිවිසුම් කිහිපයකට රජය ඇතුළත් වී ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

(viii)/

(viii) අසතුටුදායක කොන්දේසි ගණනාවක්ම තිබූ බවට වාර්තා වූන කොළඹ ගෑස්, ඕරියන්ට් ලංකා, කොටගල, එයාර් ලංකා, නවක්කාල් ආදිය හා සම්බන්ධ ගිවිසුම් ඒ හා සමානව අත්හිටුවීමට 1 වන විත්තිකරු මැදිහත් නොවූනේ මන්ද?

31. (i) යොමු අංක. EA/05/26 දරණ ලිපි ගොනුවෙහි නොයෙකුත් සංදේශ සහ සටහන් සාක්ෂි දරණ පරිදි මුදල් අමාත්‍යංශයේ ලිපිගොනු වල ඇති නොයකුත් සංදේශ පත්‍ර සහ සටහන් වලින් සාක්ෂි දරන පරිදි, ඇති කරගත් කථා බහ සහ එළඹෙන ලද සමථය ගැන මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා සහ ගරු මුදල් අමාත්‍යවරයා යන දෙදෙනාම කෙලින්ම සහ අනියම් වශයෙන් සම්පූර්ණයෙන්ම දැන සිටි බවත් ඒවාට සම්බන්ධ වූ බවත් ඒවා අවසාන වශයෙන් තීරනය කළ බවත්, ඔබ සහාපති ඩී.වයි.ලියනගේ දන්නා බව පිළිගන්නේ නැද්ද?

(ii) 1998/06/28 වන දින අත්සන් කල සමථ ගිවිසුම් වලට ඔබ පාර්ශවකරුවකු වන බව ඔබ පිළිනොගන්නෙහිද?

(iii) සමථ කථා බහ, මුදල් අමාත්‍යංශයේ ලේකම්/මුදල් අමාත්‍යවරයා/රජය වෙනුවෙන් ක්‍රියා කළ නීතිපතිවරයා සහ/හෝ සොලිසිටර් ජෙනරාල්වරයා ඉදිරිපිට පැවැත්වූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

32. (i) සමථ ගිවිසුම් අත්හිටුවීම සිදු කිරීමේ 1 වන විත්තිකරුගේ ඉහත කී ක්‍රියා කලාපය, ක්‍රියා සහ ප්‍රකාශ කෙළින්ම, සෙක් ආයතනයේ සාමාජිකයකු වශයෙන්, වෙනත් අය අතර, ඔහුට විරුද්ධව ක්‍රියා කිරීමට රජයට කැපවීමක් ඇති කළ අංක.3 දරන සමථ ගිවිසුමේ කොන්දේසිය 1 වන විත්තිකරු විසින් සොයා ගැනීමේ සෘජු ප්‍රතිඵලයක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) 1996 ඔක්තෝබර් මාසයේදී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේදී 1996 ඔක්තෝබර් මාසයේදී ලියා අත්සන් කරන ලද පරිශිෂ්ඨයක් මගින් සමථ ගිවිසුම් වලින් බැහැර කරන ලද එකම කොන්දේසි නිශ්චිතවම 1 වන විත්තිකරුට අදාළවූ සහ ඔහුට පුද්ගලිකව බලපෑ ඉහත කී කොන්දේසිය පමණක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

33. (i) 1995 අගෝස්තු මස 08 වන දින 1 වන විත්තිකරු පාර්ලිමේන්තුවට කළ ඉහත කී ප්‍රකාශයේ තවදුරටත් -

> "කෙසේ වුවද, ඊටපසුව, මේ සමථ ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අත්සන් කරන ලද ගිවිසුම් වලින් පිළිගත නොහැකි ස්වභාවයක වූ බැඳීම් ගණනාවකට රජය යටත් කර ඇති බව නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා විසින් සොයාගෙන මුදල් අමාත්‍යවරයාට දන්වන ලදී"

යනුවෙන් 1 වන විත්තිකරු වැඩිදුරටත් ප්‍රකාශ කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) එම ප්‍රකාශය සකස් කිරීමේදී, සමථ කාරණා මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා සහ මුදල් අමාත්‍යවරයා හොඳින් දැන සිටි බව පැහැදිලිව අනාවරණය කෙරෙමින්,වෙනත් දේ අතර කථා බහ වලට අදාළ සංදේශ සහ සටහන් පිළිබඳව සාක්ෂි අඩංගු වූ මුදල් අමාත්‍යංශ යොමු අංක. EA/05/26 දරණ ලිපිගොනුවේ අදාළ ලේඛන 1 වන විත්තිකරු විසින් පරීක්ෂා කළ යුතු වූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

34./

34. (i) 1 වෙනි විත්තිකරු 1995 අගෝස්තු මස 8 වන දින පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශයේ, එළඹෙන ලද හිල්ටන් සමථ ගිවිසුම් මගින් රජයට පිළිගත නොහැකි බැඳීම් ගණනාවකට රජය යටත් කරනු ලැබූ බව ප්‍රකාශ කළ අතර, නිශ්චිතව පැමිණිලිකරුට පමණක් අදාළ වූ එක් නිශ්චිත බැඳීමක් ගැන සඳහන් කරමින් සමථ ගිවිසුම්වල පැහැදිලිව දක්වා තිබූ පරිදි රජයේ එම බැඳීමට යටත්වීමට අවශ්‍ය වූ අවස්ථාගත කරුණු හෙළි නොකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) <u>රජයට පිළිගත නොහැකි බැඳීම් ගණනාවක්ම</u> තිබූ බව 1 වන විත්තිකරු ප්‍රකාශ කරන ලදුව, එසේ රජයට පිළිගත නොහැකි වූ කොන්දේසි/බැඳීම් හඳුන්වාදීම 1 වන විත්තිකරු පැහැර හැර අතපසු කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

35. (i) 1 වන විත්තිකරුද ඇතුලත්ව සෙක් ආයතනයේ එවකට සිටි සමාජිකයන්ට විරුද්ධව රජය විසින් ක්‍රියා කළ යුතු බවට සමථ ගිවිසුමේ ඇති කොන්දේසිය අනුව සලකා බැලීමේදී, 1 වන විත්තිකරු ඇත්ත වශයෙන්ම සම්බන්ධතාවක් ඇති සහ බලපෑමට ලක්වූ පාර්ශවකරුවකු බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) 1 වන විත්තිකරුගේ පෞද්ගලික සම්බන්ධතාවය සහ 1 වන විත්තිකරුට ඇතිවූ බලපෑම ඔහු විසින් වසන් කල බවත් පාර්ලිමේන්තුවට සහ එමගින් මහජනතාවට 1 වන විත්තිකරු එය හෙළිදරව් නොකළ බවත් ඔබ පිළිගන්නේ නැද්ද?

36. (i) 1 වන විත්තිකරු විසින් පැමිණිලිකරුට අදාළ එක්තරා ඡේදයක මැද කොටස පමණක්, එහි පද සම්බන්ධතාවය නොමැතිවද හුවා දක්වමින් එහි ප්‍රථම සහ පසු කොටස් අත්හැර දමා එය පිළිගත නොහැකි කොන්දේසියක් වශයෙන් හඳුන්වමින් ද ගෙනහැර දැක්වීමෙන් 1 වන විත්තිකරුගේ ඉහත කී ප්‍රකාශය නොමග යවන සුළු ප්‍රකාශයක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) මෙය හිල්ටන් සමථයට අගතියක් සිදු කිරීමේ සහ එය අසාර්ථක කිරීමේ චේතනාවෙන් කල බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) ඉන්පසුව, 1 වන විත්තිකරු විසින් එසේ කළ ඉහත කී නොමග යවන සුළු ප්‍රකාශය කවර හෝ කිසිම අවස්ථාවක නිවැරදි කිරීමක් 1 වන විත්තිකරු නොකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

37. (අ) (i) මුදල් අමාත්‍යාංශයේ යොමු අංක.EA/05/26 දරණ ලිපිගොනුවෙන් අනාවරණය වන පරිදි, සියලුම කරුණු සම්පූර්ණයෙන් සතුව සිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා,මුදල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපති කුමාරතුංග මැතිණිය විසින් දෙන ලද විධානය මත, පාර්ලිමේන්තුවේ ඉහතකී ප්‍රශ්නයට උත්තරයක් වශයෙන් දීම සඳහා සත්‍ය සහ නිවැරදි කරුණු දක්වමින් 1995 සැප්තැම්බර් මස 18 වන දිනැති <u>නිල උත්තරයක්</u> පිළියෙල කර තිබූ බව.

(ii)/

(ii) පාර්ලිමේන්තුවේ මතු කරන ලද ප්‍රශ්න වලට උත්තර පිළියෙල කිරීම සඳහා අමාත්‍යාංශය විසින් අනුගමනය කරන සාමාන්‍ය පරිපාලනමය ක්‍රමය සහ කාර්ය පටිපාටිය එය බව.

(iii) 1995 සැප්තැම්බර් 18 වන දින දරන එම සත්‍ය සහ නිවැරදි නිළ උත්තරය 1 වන වින්තිකරු විසින් ප්‍රතික්ෂේප කර, දන්නා කරුණු වලට පටහැනිව, 1995 සැප්තැම්බර් මස 19 වන දින පාර්ලිමේන්තුවට ඔහුගේම උත්තරය ප්‍රකාශ කල බව.

ඔබගේ සභාපතිවරයා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් දැන සිටින බව ඔබ පිළිනොගන්නෙහිද?

(ආ)(i) ඉහත 11 වන විචාරණයේ සඳහන් කර ඇති ඔබගේ විරෝධතා/උත්තරවල, එකී <u>නිළ උත්තරය</u> ඒවායේ කොටසක් සහිතව, ඉහත කී කරුණු, සම්ප්‍රකාශ කර තිබෙන බව ඔබ පිළිනොගන්නේද?

(ii) එකී <u>නිළ උත්තරයේ</u> පිටපතක් ඔබ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාගත කල බව ඔබ පිළිනොගන්නෙහිද?

38. (i) 1995 දෙසැම්බර් මස 15 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර රාජිත සේනාරත්න විසින් කළ <u>ප්‍රකාශයේ</u> අනාවරණය කළ කාරණාවලට පටහැනි කරුණු ඉදිරිපත් කිරීමට සහ/හෝ ඒවා අසත්‍ය යැයි ඔප්පු කිරීමට 1 වන වින්තිකරුට නොහැකි වූ බව පිළිගන්නේ නැද්ද?

(ii) ආචාර්ය රාජිත සේනාරත්න විසින් ඔහුගේ එකී ප්‍රකාශයේ අනාවරණය කළ නොයෙකුත් කරුණු වලට පටහැනිව කරුණු ඉදිරිපත් කිරීමට සහ/හෝ ඒවා අසත්‍ය යැයි ඔප්පු කිරීමට 1 වන වින්තිකරුට නොහැකි වීමෙන් දොස්තර රාජිත සේනාරත්න විසින් ඔහුගේ එකී ප්‍රකාශයේදී අනාවරණය කළ දේ කරුණු වශයෙන් සත්‍ය සහ නිවැරදි බවද ඔප්පු වූයේ යැයි ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) එකී ප්‍රකාශය ඉදිරියේ 1995 අගෝස්තු මස 8 වන දින සහ 1995 සැප්තැම්බර් මස 9 වන දින පාර්ලිමේන්තුවට කරන ලද ඉහත කී නොමග යවන සුළු 1 වන වින්තිකරුගේ ප්‍රකාශ වල කවර හෝ නිවැරදි කිරීමක් කිරීම 1 වන වින්තිකරු පැහැර හැර අතපසු කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iv) ඉහත 11 වන විචාරණයේ සඳහන් කරන ලද ඔබගේ විරෝධතාවල/උත්තරවල, එම <u>ප්‍රකාශයේ</u> පිටපතක් ඒවායේ කොටසක් සහිතව, ඉහත කී කරුණු සම්ප්‍රකාශ කර ඇති බව ඔබ පිළිනොගන්නේද?

(v) 1995/12/15 වන දින හැන්සාඩ් වාර්තාවේ එම <u>ප්‍රකාශයේ</u> පිටපතක් ඔබ මණ්ඩලයේ සභාගත කල බව ඔබ පිළිනොගන්නෙහිද?

39./

39. (i) දොස්තර රාජිත සේනාරත්න මහතාගේ එකී ප්‍රකාශයේ ඔහු විසින් සඳහන් කළ එක් කරුණක් වූයේ අර්බුදයක් ඇති කිරීමේ සහ ප්‍රධාන වශයෙන් රජයේ සම්බන්ධතා ආරක්ෂා කිරීමට කොළඹ දිසා අධිකරණයේ අංක.4414/විශේෂ දරණ නඩුවේදී භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන් මුදල් අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම් ඒ.එස්.ජයවර්ධන මහතා විසින් දිවුරුම් ප්‍රකාශයක් ගොනුකිරීම නිසා, 1995 නොවැම්බර් මාසයේදී ඔහුට ඉල්ලා අස්වීමට බල කිරීම 1 වන විත්තිකරුගේ ක්‍රියා කලාපය සහ ක්‍රියා බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) මුදල් අමාත්‍යවරයා එකී දිවුරුම් ප්‍රකාශය පරීක්ෂා කර බලා ඒ.එස්.ජයවර්ධන මහතාට වරද නොපැටවූ බවත්, ඊට පටහැනිව ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වශයෙන් ඉහළ තනතුරකට පත්කළ බවත්, ඔබ සභාපතිවරයා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන්, දන්නා බව ඔබ පිළිනොගන්නෙහිද?

(iii) අධිකරණ සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කටයුතු අමාත්‍යවරයා වශයෙන් 1 වන විත්තිකරුගේ ඉහත කී ක්‍රියා කලාපය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වන ව්‍යවස්ථාව අනුව අනිසි බව ඔබ පිළිගන්නේ නැද්ද?

40. (i) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ හිල්ටන් සමථ ගිවිසුම් වලට, නීතිපතිවරයා විසින් සකස් කර අවසන් කරන ලද පරිශිෂ්ටයන් ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්/මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ පැමිණිලිකරු විසින් සහ අතර ලියා 1996 ඔක්තෝබර් මස අත්සන් කිරීමට යෙදුණු බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

(ii) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ හිල්ටන් සමථ ගිවිසුම්, අන්‍යොන්‍ය වශයෙන් අදාළ වූද, අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ වූද, අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකට රැඳී සිටින්නා වූද, 1 සිට 4 දක්වා වූ ගිවිසුම් සංඛ්‍යාවකින් සැදුණු, එක් සංධාන සමථයක අත්‍යාවශ්‍ය කොටස් බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

(iii) එකී සමථ ගිවිසුම් වලට වූ 1996 සැප්තැම්බරයේදී/ඔක්තෝබරයේදී ලියා අත්සන් කරන ලද ඉහත කී පරිශිෂ්ටය යටතේ, ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට/භාණ්ඩාගාරයේ ලේකම්ට, අවලංගු කළ නොහැකි, ස්ථිර සහ නිශ්චිත ඇටෝර්නි බලපත්‍රයක් දී තිබෙන බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

(iv) එකී ඇටෝර්නි බලපත්‍ර මගින්, අංක.3 හා 4 දරණ ගිවිසුම්වල අන්තර්ගත පූර්වගත කොන්දේසි ක්‍රියාත්මක කිරීමේ නිශ්චිත කාර්යය සඳහා ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) විසින් දරනු ලබන එච්ඩීඑල් සමාගමේ කොටස් ධාරිතාවෙන් 15% ක ප්‍රමාණයක් මත ඡන්දය දීමට භාණ්ඩාගාරයේ ලේකම්ට සහ/හෝ ඔහුගේ නියෝජිතයාට අධිකාරය හා බලය දී ඇති බව ඔබ පිළිනොගන්නෙහිද? නැතහොත් එම ඇටෝර්නි බලය මගින් දුන් බලය කුමක්ද?

(v)/

(v) එමගින්, ඔබගේ කොටස් ධාරිතාවෙන් 80% ක ඡන්දය දීමේ අයිතිවාසිකම, එකී පරිශිෂ්ටය මගින් විශේෂයෙන් බැහැර කරන ලද එක් කොන්දේසියක් හැරෙන්නට එකී අංක. 1 සිට 4 දක්වා වූ සමථ ගිවිසුම්වල අන්තර්ගත සියලු කොන්දේසි ඉටු කිරීම සහතික කිරීම පිණිස, රජය නියෝජනය කරන, මුදල් අමාත්‍යාංශයේ ලේකම්/භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරීම පිණිස. පැමිණිලිකරු විසින් සාකච්ඡා කරන ලද බව සහ ඒ අයිතිය එලෙස ලබාගත් බව ඔබ පිළිනොගන්නෙහිද?

(vi) එකී පරිශිෂ්ටය මගින්, එකී සමථ ගිවිසුම් වලින් බැහැර කරනු ලැබූ එකම වැදගත් කොන්දේසිය නම්, 1 වන වින්තිකරුද ඇතුළත් සෙක් ආයතනයේ සාමාජිකයන්ට විරුද්ධව කටයුතු කිරීමට රජය විසින් ගැනීමට තිබූ ක්‍රියාවන්ට අදාළ (මෙහි පහත දැක්වෙන) අංක.3 දරණ ගිවිසුමේ අංක.5 දරණ වගන්තිය පමණක් බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

> "5. එච්ඩීඑල් සමාගමට අදාළ කාරණා සම්බන්ධයෙන් අමරසේකර මහතා විසින් එකී ආයතන වෙත කරන ලද නියෝජනයන්ට අදාළව, ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ/හෝ ඒ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ සහ කොළඹ කොටස් වෙළඳපොළේ සහ/හෝ එහි අධ්‍යක්ෂවරයන්ගේ ක්‍රියාකලාපය හා ක්‍රියාවන් සම්බන්ධයෙන් රජය විසින් නිසි සහ ස්වාධීන ක්‍රියා මාර්ගයක් ගත යුතු අතර, එකී කාරණා සම්බන්ධයෙන් දිගටම ක්‍රියා කරගෙන යාමේ අයිතිය අමරසේකර මහතා විසින් තමා වෙත ද, රඳවා තබාගනු ඇත."

(vii) ඉහත කී කොන්දේසිය බැහැර කිරීමට පැමිණිලිකරු එකඟ වූයේ, අධිකරණ අමාත්‍යවරයා වශයෙන් සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වශයෙන් සියල්ලන්ම 1 වන විත්තිකරුගේ විෂය පථය යටතට වැටෙන වත්මන් නීතිපතිවරයා වූ, ජනාධිපති නීතිඥ සරත් සිල්වා මහතාගේ, එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් වූ බී.සී.පෙරේරා මහතාගේ සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ආචාර්ය පී.බී.ජයසුන්දර මහතාගේ දැඩි ඉල්ලීම මත බව ඔබගේ සභාපතිවරයා දන්නා බව ඔබ පිළිනොගන්නෙහිද?

(viii) පරිශිෂ්ටය සහ ඒ පරිශිෂ්ටය යටතේ ජපන් සමාගම් (මිට්සුයි සහ තායිසේ) විසින් දෙන ලද වෙනස් කළ නොහැකි ඇටෝර්නි බලපත්‍රය යටතේ සහ ඒවායේ නියමයන් පරිදි, ඉහත 40(vi) විචාරණයේ සඳහන් එක් කොන්දේසියක් හැර, 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ අංක.1 සිට 4 දක්වා වූ සමථ ගිවිසුම්වල සියලු කොන්දේසි ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට රජය එකඟ වූ බව සහ පොරොන්දු වූ බව ඔබ පිළිනොගන්නෙහිද?

(ix)/

(ix) 1996 ඔක්තෝබරයේදී එකී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට පෙරාතුව, 1995 අගෝස්තු මස 08 වන දින 1 වන විත්තිකරු විසින් පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයෙහි රජයට පිළිගත නොහැකි එක් කොන්දේසියක් ලෙස 1 වන විත්තිකරු විසින් හඳුන්වනු ලැබූ අංක.3 දරණ සමථ ගිවිසුමේ ඒ කොන්දේසිය ම ඔහුගේ එම ප්‍රකාශය අසත්‍ය බවට පත් කරමින්, 1996 සැප්තැම්බර්/ඔක්තෝබර් මාසයේදී නීතිපතිවරයා විසින් බලාත්මක කොට ක්‍රියාත්මක කරන ලද බව ඔබගේ සභාපති ඩී.වයි.ලියනගේ සහ අධ්‍යක්ෂ ආචාර්ය පී.බී.ජයසුන්දර දන්නා බව ප්‍රතික්ෂේප කරන්නේද?

41. (i) 1 වන විත්තිකරු විසින් සිදු කරන ලද හිල්ටන් සමථ ගිවිසුම් අත්හිටවීම ඉවත් කර ගැනීම සම්බන්ධයෙන්, නීතිපතිවරයා විසින් අනුමත කරන ලද පරිදි වූ ප්‍රකාශයක් සහ කලින් ඇතිකර තිබෙන වැරදි අවබෝධ නිවැරදි කරමින් අදාළ කරුණු පිළිබඳව සත්‍ය හා නිවැරදි ප්‍රකාශයක් 1996 දෙසැම්බර් මාසයේදී මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා කරන විට පාර්ලිමේන්තුවට කරන ලෙස 1 වන විත්තිකරුට නියම කර තිබූ බව ඔබගේ සභාපති ඩී.වයි.ලියනගේ හා අධ්‍යක්ෂ ආචාර්ය පී.බී.ජයසුන්දර දැනගෙන සිටිය බව ඔබ පිළිනොගන්නේද?

(ii) 1 වන විත්තිකරු එසේ කිරීම පැහැර හැරිය බව සහ නොසලකා හැරිය බව ඔබ පිළිනොගන්නේද?

42. (i) ඔබේ සභාපති ඩී.වයි.ලියනගේ මහතා, අධ්‍යක්ෂ පී.බී.ජයසුන්දර මහතා විසින් අත්සන් කරන ලද්දා වූද, ඔබේ ලේකම්වරුන් විසින් 1997 නොවැම්බර් මස 07 වන දින සංසරණය කිරීමට සලස්වන ලද්දා වූද, ඔබේ ත්‍රෛමාසික ගිණුම් වලින්, ප්‍රමාදය සඳහා පොලිය වශයෙන් ඔබ විසින් ජපන් යෙන් 156,478,693 ක (ශ්‍රී ලංකා රු.79,629,171/- ක) අතිරේක මුදලක් ගෙවා ඇති බැව් අනාවරණය වූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

(ii) ඔබට ගෙවන්නට සිදු වූ එකී අතිරේක පොලිය එසේ දරන්නට සිදු වූයේ හිල්ටන් සමථය 1 වන විත්තිකරු විසින් නීතිවිරෝධී ලෙස අත්හිටවීමට සැලසූ නිසා බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

43. හිල්ටන් සමථය 1 වන විත්තිකරු විසින් අත්හිටවීමට සැලසූ නිසා, පැමිණිලිකරු විසින් භාත් කාර්ය සඳහා විශේෂිතවම සාකච්ඡා කොට ලබාගත් ඉතිරි ණය මුදල ආපසු ගෙවීම උදෙසා වූ එක් අවුරුදු ක්ෂමා කාලසීමාව තුළදී, අංක.2 දරණ සමථ ගිවිසුමේ 13 වන හා 14 වන වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි, ඔබේ මූල්‍ය කටයුතු තවදුරටත් ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ඔබ පිළිනොගන්නෙහිද?

44. (i) ඔබගේ ඉහත කී ත්‍රෛමාසික ගිණුම් වලින්, 1997 ජූලි මස 01 වන දින ජපන් සමාගම් වලට (මිට්සුයි හා තායිසේ) ගෙවීම් කිරීම පිණිස ඔබ වෙනුවෙන්, රු.288,567,634 ක අතිවිශාල මුදලක් රජයට ගෙවීමට සිදු වූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එසේ නොමැති නම්, ගෙවන ලද්දේ කොපමණද?

(ii)/

(ii) ඉහත සඳහන් කරන ලද පරිදි, මහජන මුදල් භාවිතා කරමින් එවැනි අතිවිශාල මුදල් සම්භාරයක් රජයට ගෙවන්නට සිදු වූයේ හිල්ටන් සමථය 1 වන වින්තිකරු විසින් අත්හිටවීමට සැලැස් වූ නිසා බවත්, එසේ අත්හිටවීම නිසා ඉහත සඳහන් කරන ලද පරිදි, ඔබේ මූල්‍ය කටයුතු තවදුරටත් ප්‍රතිව්‍යූහකරණය වළක්වන ලද බවත්, ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

45. (i) සඳහන් කරන ලද අවස්ථාගත කරුණු අනුව, ඔබට/රජයට එලෙස අලාභ සිදු කිරීම, 1994 අංක.20 දරණ අල්ලස් (සංශෝධන) පනත යටතේ අර්ථ නිරූපණය කර ඇති "දූෂණය" යන්නෙහි අර්ථය තුළට වැටෙන බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

(ii) අභියාචනාධිකරණයේ අංක.775/98 දරණ ප්‍රතිශෝධන අයදුම්පතේ (1 වන වින්තිකරුට විරුද්ධව පැමිණිලිකරු විසින් පමුණුවා ඇති කොළඹ දි.උ. අංක.19849/එම්.ආර්. දරණ නඩුව) ඉදිරිපත් කරනු ලැබ ඇති 1998/08/29 දිනැති ඔහුගේ දිවුරුම් ප්‍රකාශයෙහි 8 වන ඡේදයෙහි : **"...... ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැනුම්දීමක් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(2) ව්‍යවස්ථාව යටතේ, මුදල් විෂයයට අදාළව කිසියම් බලයක් හෝ කාර්ය භාරයක් මට පවරා නොමැත"** යනුවෙන් 1 වෙනි වින්තිකරු සහතික කරනු ලැබ ඇති බව ; ඔබ පිළිනොගන්නෙහිද?

(iii) 1 වන වින්තිකරුගේ එකී දිවුරුම් ප්‍රකාශයේ පිටපතක් ඔබ මණ්ඩලයේ සභාගත කල බව ඔබ පිළිනොගන්නෙහිද?.

46.(අ) හිල්ටන් සමථයට අදාල වන්නා වූ වාර්තා මුදල් අමාත්‍යාංශයේ යොමු අංක. EA/05/26 දරණ ලිපි ගොනුවේ ඇති බව ඔබ සභාපති, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් දැන සිටින බව ඔබ පිළිනොගන්නෙහිද?

(ආ) ඒ අනුව :

(i) සමථයේ නියමයන්, 1995 ජූනි මස 28 වන දින එළඹෙන ලද සමථ ගිවිසුම්වල ඇතුළත් සියලු කොන්දේසි පිළිබඳව නීතිපතිවරයා/ඔහුගේ නිළධාරීන් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්/ඔහුගේ නිළධාරීන් ඉදිරිපිට දී 1992 ඔක්තෝබර් මස එකඟ වූ බව ;

(ii) ගිවිසගත් සමථ නියමවල පදනම මත පසුව 1993 දී නීතිපතිවරයා විසින් සමථ ගිවිසුම්වල කටයුතු සමාප්ත කළ බව ;

(iii) පසුව 1994 ජූනි වලදී, නීතිපතිවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරුණු පැහැදිලි කර දීමෙන් පසු විජේතුංග ජනාධිපතිතුමා විසින් සමථ ගිවිසුම් අනුමත කිරීමට යෙදුණු බව සහ ඒවා ක්‍රියාවේ යොදන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට හෝ ඔහු නොමැති නම් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට අධිකාරය හා බලය දුන් බව ;

(iv)/

(iv) ඔබ ණයකරු වූයේ වී නමුදු, ඇපකරු වශයෙන් සිටින ශ්‍රී ලංකා රජයෙන් පොරොන්දු නෝට්ටු ලබා ගැනීමට ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) විසින් බලකර ඉල්ලා සිටීමේ කොන්දේසිය නිසා පැමිණිලිකරු සමථ ගිවිසුම් ක්‍රියාවේ යෙදවීමට ප්‍රතික්ෂේප කළ බැවින්, එකී සමථ ගිවිසුමේ අවශ්‍ය කරන ලෙසින්ම ක්‍රියාවේ නොයෙදූ බව ;

(v) අනතුරුව ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) කොන්දේසිය සම්බන්ධයෙන් කණගාටු වූ බැවින්, ඔබේ මූල්‍ය කටයුතු ප්‍රතිව්‍යුහකරණය කිරීමට/**ඔබ විසින් ණය මුදල ආපසු ගෙවීම පහසු කරවමින් එහි ණය ප්‍රතිලේඛනගත කිරීමට යටත්ව,** කලින් කටයුතු සමාප්ත කර තිබුණු සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම කරගෙන යන ලෙස, මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1994 ඔක්තෝබරයේදී නීතිපතිවරයා වෙත ලියා යවන ලද බව ;

(vi) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ අංක 1 සිට 4 දක්වා වූ සමථ ගිවිසුම් එලෙස කටයුතු අවසන් කර ඇති බව ;

(vii) 1 වන විත්තිකරු විසින් සමථ ගිවිසුම් අත්හිටුවීමට සැලැස්වීම **මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් 1994 ඔක්තෝබර් මස 19 වෙනි දින දරන ලිපියෙන් දෙන ලද විධානය නිශ්ඵල සහ බලරහිත කල බව** ;

ඔබගේ සභාපතිවරයා දැනසිටි බව ඔබ පිළිනොගන්නේද?

(ඇ) ඉහත 11 වන විමාරණයේ සඳහන් කර ඇති ඔබගේ විරෝධතාවල/උත්තරවල ඉහත කී කරුණු ඔබ විසින් සම්ප්‍රකාශ කර ඇති බව ඔබ පිළිනොගන්නේද?

වර්ෂ 1999 ක්වූ මැයි මස 03 වෙනි දින දීය.

පැමිණිලිකරුගේ නීතිඥ.